කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
கொழும்புப் பல்கலைக்கழகம், இலங்கை
**UNIVERSITY OF COLOMBO, SRI LANKA**

අපේ අංකය / Our Ref. No. :
ඔබේ අංකය / Your Ref. No. :

2021.05.11

මණ්ඩපාධිපති
සියළුම පීඨාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්/ පාසල
ලේඛකාධිකාරී
වැඩබලන පුස්තකාලයාධිකාරී
මූල්‍යාධිකාරී
අධ්‍යයනාංශ ප්‍රධානීන්
පරිපාලන හා මූල්‍ය නිලධාරීන්

<u>විශ්වවිද්‍යාල කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම</u>

2021.04.28 දිනැතිව 'විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සේවය සඳහා වාර්තා කිරීම' යන මැයෙන් හා 2021.05.03 දිනැතිව 'විශ්වවිද්‍යාලයේ පරිපාලන හා අනෙකුත් ක්‍රියාකරකම් පවත්වාගෙන යාම' යන මැයෙන් මා විසින් නිකුත් කරන ලද ලිපි හා 2021.05.10 දින විශ්වවිද්‍යාල නිලධාරීන් සමඟ පැවති විශේෂ රැස්වීමේදී ගන්නා ලද තීරණ හා බැඳේ.

කරුණාකර පහත උපදෙස් පරිදි කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

1. 2021 මැයි 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021 (II) හි දක්වා ඇති විධිවිධාන වලට අනුකූලව 2012.04.28 දිනැති මාගේ පෙර ලිපියේ පළමු ඡේදය සංශෝධනය වන අතර, ඒ අනුව දෙපාර්තමේන්තුවේ/ අංශයේ / ඒකකයේ කටයුතු අඛණ්ඩව හා බාධාවකින් තොරව කරගෙන යාම සඳහා අවශ්‍ය වන අවම සේවක මණ්ඩලය සේවා මුර සඳහන් ලේඛනයකට (Roster) අනුව ගෙන්වා ගැනීමට (මණ්ඩපාධිපති/ පීඨාධිපති/ අධ්‍යක්ෂ /ලේඛකාධිකාරී / වැඩබලන පුස්තකාලයාධිකාරී/ මූල්‍යාධිකාරී සමඟ සාකච්ඡා කොට) එක් එක් දෙපාර්තමේන්තුවේ / අංශයේ / ඒකකයේ ප්‍රධානීන්ට බලය ඇත.

2. උනන්දු දක්වන සියලු පාර්ශවයන්ට එකී තොරතුරු ලබා ගත හැකි වන පරිදි සේවා මුර සඳහන් ලේඛනය, අදාළ අංශ සම්බන්ධ කර ගත හැකි තොරතුරු ද සමඟ දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ දැන්වීම් පුවරුව තුළ ප්‍රදර්ශනය කිරීම සුදුසුය.

තැපැල් පෙට්ටි අංකය 1490, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 3, ශ්‍රී ලංකාව P.O. Box No. 1490, Cumaratunga Munidasa Mawatha, Colombo 3, Sri Lanka
தபாற்பெட்டி இல.1490, குமாரதுங்க முனிதாச மாவத்த, கொழும்பு 3. இலங்கை.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන අංක: / தொலைபேசி இல: / Telephone Nos : | Vice-Chancellor | : | 2583810 | Fax : | 2586059 | E-mail : | vc@cmb.ac.lk |
| | Registrar | : | 2583818 | Fax : | 2553188 | E-mail : | registrar@cmb.ac.lk |
| | Bursar | : | 2586652 | Fax : | 2586652 | E-mail : | bursar@cmb.ac.lk |
| | General | : | 2581835, 2584695, 2585509 | | | | |

3. සේවා මුර සඳහන් ලේඛනයට අනුව සේවකයා රාජකාරියට කැඳවනු නොලබන දිනවල පවා "සේවකයින් නිවසේ සිට අන්තර්ජාලය හරහා වැඩ කිරීමට" (WOFH) සූදානම් විය යුතුය.

4. ගර්භනී සේවකයින් සේවා ස්ථානය වෙත නොකැඳවිය යුතු අතර, නිවසේ සිට ඉටුකරන රාජකාරි සම්බන්ධයෙන් ගූගල් පෝරමයක් පවත්වා ගැනීමට ඔවුන්ට උපදෙස් දිය යුතුය.

5. සෞඛ්‍ය හා ආරක්ෂක මාර්ගෝපදේශයන් පිළිපදිමින් අත්‍යවශ්‍ය රාජකාරි කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට, අවශ්‍ය අවම සේවක පිරිසක් සේවය සඳහා යෙදවීම දෙපාර්තමේන්තුවේ / අංශයේ / ඒකකයේ ප්‍රධානියාගේ වගකීම වේ.

6. 2021.04.28 සහ 2021.05.03 දිනැති ලිපි මඟින් දක්වා ඇති වෙනත් නියමයන් සහ කොන්දේසි නොවෙනස්ව පවතී.



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රිකා එන්. විජයරත්න
උපකුලපති